# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1704/18 - 2011 මැයි 06 වැනි සිකුරාදා - 2011.05.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2006 අංක 10 දරන දේශීය ආදායම් පනත**

217 වැනි වගන්තිය යටතේ නිවේදනය

2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 217 වැනි වගන්තිය යටතේ (විශ්‍රාම වැටුප්, අර්ථ සාධක, පාරිතෝෂික හෝ ඉතුරුම් අරමුදල් සම්බන්ධයෙන් "කොමසාරිස් ජනරාල්වරයා විසින් අනුමත කරන ලද" යන අර්ථ දැක්වීමට අදාලව) මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්, කන්දෙ මොහොට්ටාලලාගේ සුනිල් කන්දෙගෙදර වන මම මෙම නිවේදනය මගින්, 2009 අප්‍රේල් මස 28 දිනැති අංකඃ 1599/13 දරන *අති විශේෂ ගැසට් නිවේදනයෙහි* පල කරන ලද, එකී පනතේ ඉහත වගන්තිය යටතේ වූ නියෝගයෙහි උපලේඛනය ඉවත් කර ඒ වෙනුවට, එම පනතේ 25(1)(උ) හා 25 (1)(ච) වගන්තියේ කාර්ය සඳහා අනුමත කරන යම් අර්ථ සාධක, පාරිතෝෂික, විශ්‍රාම වැටුප් හෝ ඉතිරි කිරීම් අරමුදලක් විසින්ම (දැනට අනුමැතිය දී ඇති අරමුදල් ද ඇතුලුව) පොදුවේ පිළිපැදීමට යටත් විය යුතු කොන්දේසි නිශ්චිතව දක්වා ඇති, පහත සඳහන් උපලේඛනය ආදේශ කරමි.

"උපලේඛනය

(1) ඕනෑම ගිණුම් වර්ෂයක් තුළ සේවා යෝජකයෙකු විසින් සියළුම අරමුදල් සඳහා (එනම් සෑම අර්ථසාධක අරමුදලක්, ඉතිරි කිරීම් අරමුදලක්, විශ්‍රාම වැටුප් අරමුදලක්, භාරකාර අරමුදලක් හෝ පාරිතෝෂික අරමුදල් වැනි) ගෙවනු ලබන මුළු දායක මුදල, එම වර්ෂය සඳහා එකී සේවා යෝජකයාගේ මුළු වැටුප් බිලෙන් 25%ක් නොඉක්මවිය යුතු ය.

(2) නිශ්චිත ආයෝජනයක් සඳහා විශේෂ අනුමැතිය ලබා දී ඇත්නම් මිස එවැනි අරමුදලක් මගින් සිදු කරනු ලබන ආයෝජන, පහත සඳහන් සීමාවන් සමග අනුකූල විය යුතු ය-

(i) අවම වශයෙන් අරමුදලේ මුදල් වලින් 40%ක් ලංකා බැංකුව, මහජන බැංකුව, ජාතික ඉතිරිකිරීමේ බැංකුව හෝ රජයේ සුරැකුම් පත්වල තැන්පතු ස්වරූපයෙන් ආයෝජනය කර තිබිය යුතු ය.

(ii) අරමුදලේ මුළු මුදලින් 20%කට වැඩි නොවන පරිදි ඉතිරිය ලැයිස්තුගත ණයකර හෝ වෙනත් ලැයිස්තුගත ස්කන්ධ වල ආයෝජනය කළ හැකිය.

(iii) යම් ඉතිරියක් අනෙකුත් වාණිජ බැංකුවල තැන්පතු ස්වරූපයෙන් ආයෝජනය කළ යුතු ය."

කන්දෙ මොහොට්ටාලලාගේ සුනිල් කන්දෙගෙදර,
දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්.

2011ක් වූ අප්‍රේල් මස 25 වැනි දින,
කොළඹ,
දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ දී ය.

05-487

1A - G 14492— 1860 (2011/05)  ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.